පරිපාලන නියෝග 10 / 2017

මගේ අංක : පා/1/2/5/2
කෘෂිකර්ම දෙපාර්තමේන්තුව,
පේරාදෙණිය.
2017.10. 20

සියළුම අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්,
සියළුම අධ්‍යක්ෂවරුන්/ ප්‍රධාන ඉංජිනේරු/ ප්‍රධාන ගණකාධිකාරී,
පළිබෝධනාශක රෙජිස්ට්‍රාර්/ ප්‍රධාන අභ්‍යන්තර විගණක,
ප්‍රධාන කෘෂි විශේෂඥ / ප්‍රධාන කෘෂි විද්‍යාඥ,
අතිරේක අධ්‍යක්ෂවරුන් ,
නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන්,
සහකාර අධ්‍යක්ෂවරුන්,
ස්ථාන භාර නිලධාරීන්,
පරිපාලන නිලධාරීන්,
ඒකක / ශාඛා ප්‍රධානීන්.

<u>**දෙපාර්තමේන්තුවේ ලිපිගොනු පිරික්සා තීරණ ගැනීම සඳහා තොරතුරු නිකුත් කිරීම.**</u>

දෙපාර්තමේන්තුවේ විවිධ අංශ මගින්, එම අංශ වල පවත්නා ලිපි ගොනු වල තොරතුරු නිකුත් කිරීම විධිමත් ආකාරයෙන් සිදු නොවන අවස්ථාවන් ද වාර්තා වීම මත, එමගින් ඇති වන වැරදි හා අඩුපාඩු අවම කර ගැනීමේ අරමුණින් මෙම පරිපාලන නියෝගය නිකුත් කරනු ලැබේ.

02. විශ්‍රාම ගැන්වීම, ස්ථාන මාරු කිරීම, උසස් කිරීම, විදෙස් ශිෂ්‍යත්ව සහ විදෙස් නිවාඩු අනුමත කිරීම යන අවස්ථාවන්හිදී, අදාල නිලධාරියා සම්බන්ධයෙන් විනය කරුණු / අයවීම / නොපවරා ගැනීම් පවතින්නේ ද යන්න අදාල අධ්‍යක්ෂවරයා වෙතින් විමසනු ලැබේ. එවන් අවස්ථා වලදී, නිවැරදි තොරතුරු නොලැබීම හේතුවෙන්, රාජකාරි කටයුතු ඉටු කිරීමේදී, පරිපාලන අංශය මෙන්ම, අදාළ අනෙකුත් අංශ සහ කාර්ය මණ්ඩලය ද විවිධාකාර අපහසුතාවන්ට ලක් වේ.

03. මින් ඉදිරියේදී විනය කටයුතු පිළිබඳ විමසීම් වලට අදාල ලිපි සහ පවත්නා බැදීම්, අයකර ගැනීම් සහ නොපවරා ගැනීමේ ලිපි නිකුත් කිරීමේදී මෙන්ම, එම කරුණු වලට අදාල තීරණ ගැනීම සඳහා ලිපිගොනු වල සඳහන් අත්‍යවශ්‍ය වූ තොරතුරු ලබා දීමේදී, අවම වශයෙන්, අනිවාර්යයෙන්ම අංශය භාර ආසන්නතම මාණ්ඩලික නිලධාරියා ගේ අත්සනින් හෝ නිකුත් විය යුතු බව මෙයින් අවධාරණය කරනු ලැබේ.

04. ආසන්නතම මාණ්ඩලික නිලධාරියා නොමැති අවස්ථාවක් වූයේ නම්, ඔහු/ඇය වෙනුවෙන් රාජකාරි ආවරණය කරන හෝ වැඩ බලන මාණ්ඩලික නිලධාරියා ගේ අත්සනින් යුතුව අදාල තොරතුරු නිකුත් කිරීම කළ හැකි බව ද වැඩිදුරටත් කාරුණිකව දන්වමි.

05. ඉහත නියෝගයන්ට පටහැනිව කටයුතු කරන ඕනෑම අයෙකු වෙත විනයානුකූලව කටයුතු කිරීමට සිදු වන බව ද කාරුණිකව දන්වා සිටින අතර, මේ සම්බන්ධයෙන් ඔබ යටතේ වන සියළුම ආයතන/ මධ්‍යස්ථාන/ ඒකකයන්හි අදාල වන සියළු නිලධාරීන් දැනුවත් කරන ලෙසත්, ඒ අනුව ක්‍රියාත්මක වීමෙන් වඩාත් ඵලදායී සේවාවක් ලබා දීමට සහ ලබා ගැනීමට දායක වන ලෙසත් වැඩිදුරටත් කාරුණිකව දන්වමි.

එච්.පී. දයා මැණිකේ සරත්චන්ද්‍ර,
ශ්‍රී.ලං.ප.සේ. (විශේෂ ශ්‍රේණිය).
අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන).
කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට.

පිටපත් :

01. ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය. - කාරුණික දැන ගැනීමට.
02. විගණකාධිපති - එම
03. පරිපාලන නිලධාරී (පාලන 03) - විනය කරුණු ඇති/නැති බවට ලිපි සහ බැදීම් අය කර ගැනීම් සහ නොපවරා ගැනීමේ ලිපි ඔබගේ අත්සනින් යුතුව නිකුත් කිරීමට සහ ලැබෙන පිළිතුරු මාණ්ඩලික නිලධාරීගේ අත්සන් සහිතව ලැබීමේ ප්‍රගතිය වාර්තා කිරීම සඳහා.